සැ. යු. - 2008.04.25 දින පළවූ අංක 1547 දරන ගැසට් පත්‍රයේ III කොටස සහ IV කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,548 - 2008 මැයි මස 02 වැනි සිකුරාදා - 2008.05.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
| --- | --- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — |
| බඩු බාහිරාදිය විකිණීම් | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් | 458 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | 459 |
| විවිධ දැන්වීම් | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අප්‍රේල් මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### සමාගමේ නාමය වෙනස් වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 8(2) වන වගන්තිය ප්‍රකාරව වර්ෂ 2008 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින සිට බලපැවැත්වේ.

| | | |
|---|---|---|
| සමාගමේ කලින් නාමය | : | බිස්නස් ටෙක්නොලොජි එලයන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | **N(PVS)**33690 |
| සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | 385 සී, 2 වන මහල, කොටා පාර, රාජගිරිය. |
| සමාගමේ නව නාමය | : | ඇසට් සොෆ්ට්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් |

මණ්ඩලයේ අණ පරිදි,
පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
අධ්‍යක්ෂ.

05-43

---

තිදොර තියෙටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියෙන්ටඩ් රිසච් ඇන්ඩ් ඇඩ්වොකසි 2008.03.04 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | තිදොර තියෙටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියෙන්ටඩ් රිසච් ඇන්ඩ් ඇඩ්වොකසි |
| සමාගමේ අංකය | : | **GA**2081 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 1136/බී 5, පන්නිපිටිය පාර, තලවතුගොඩ. |

ලේකම්.

05-21

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වෙනි ඡේදයට අනුව 2008 මාර්තු 19 වෙනි දින රේප්‍රොපර්ටි සොලුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වමි.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | රේ ප්‍රොපර්ටි සොලුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | පීවී 63491 |
| ලියාපදිංචි කල දිනය | : | 2008 මාර්තු 19 වැනි දින |
| ලියාපදිංචි කාර්යාලය | : | 7/බී, රූපසිංහ මාවත, නුගේගොඩ. |

තරුෂා කලේයා මහත්මිය,
ඩිරෙක්ටර්.

05-32

### සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම්දීම

2007 වසරේ අංක 7 දරන සමාගම් ආඥාපනතේ අංක 9 වගන්තිය (1) ප්‍රකාරව වගන්ති 5 පරිදි වර්ෂ 2008ක් වූ මාර්තු 25 දින ඇග්රෝ හරපන් ලෙස්ටාරි (පුද්ගලික) සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමු.

| | | |
|---|---|---|
| සමාගමේ නාමය | : | ඇග්රෝ හරපන් ලෙස්ටාරි (පුද්ගලික) සමාගම |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | පීවී 63565 |
| ලියාපදිංචි කාර්යාලය | : | 61, ජනාධිපති මාවත, කොළඹ 01 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
කාසන්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු.

05-08

---

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර ඩිසයින් ඩුවෝ (ප්‍රයිවට්) ලිමිටඩ් **(Design Duo (Private) Limited)** 2007 මාර්තු 5 වන දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

| | | |
|---|---|---|
| සමාගමේ නම | - | ඩිසයින් ඩුවෝ (ප්‍රයිවට්) ලිමිටඩ් **(Design Duo (Private) Limited)** |
| සමාගමේ අංකය | - | පීවී 63296 |
| ලියාපදිංචි කාර්යාලය | - | අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අධ්‍යක්ෂ, කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු ඩිසයින් ඩුවෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.
**(Design Duo (Private) Limited)**

05-01

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෙයියන්තුඩුව මාබිම අංක 187 දරන ස්ථානයේ පදිංචි කලුසායක්කාරගේ රංජිත් ආනන්දසිරි (ජා.හැ. අංක 621740059V හිමි වන මම එකී ජනරජයේ හෙයියන්තුඩුව මාබිම අංක 187 දරන ස්ථානයේ පදිංචි වික්‍රමසිංහ පේලිගේ නීලා චාන්දනී වික්‍රමසිංහ ජා. හැ. අංක 675693200V හිමි යන අයට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එඩිප්පුලි ආරච්චිගේ දොන් ආනන්ද වීරසේකර මහතා විසින් වර්ෂ 2006ක් වූ පෙබරවාරි මස පළමුවන දින ලියා සහතික කළ අංක 235 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් දී තිබූ සියලුම බලතල මෙයින් අවලංගු කර සිටින බව උතුම් වූ ශ්‍රී ලංකා ආණ්ඩුවටත් සියලුම ශ්‍රී ලංකාවාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මෙයට,
කලුසායක්කාරගේ රංජිත් ආනන්ද සිරි.

05-15

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - රත්නපුර නගර ශාඛාව**

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ වැලිවිට ගමේ පිහිටි ගොඩපරගහවත්ත නැමැති ඉඩමට අවසරලත් මානක ඩී. ප්‍රසාද් විමලසේන මහතා 1994.12.24 දින සකස් කරන ලද අංක 1603 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස සඳහන් පර්චස් 20ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලුම දේ සමග අංක 5 ලෙස ලකුණු කර ඇති බිම් තීරුවේ අඩි 12ක් පළල පාරේ මාර්ග අයිතිය ද වේ.

විශාලත්වය (අ. 0, රූඩ්. 0, පර්. 20)

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.05.29 වැනි දින පෙ. ව. 10.30ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.05.23 වැනි දින ද, ඩේලි නිවුස් සහ දිනමිණ පුවත්පත් වල 2003.05.08 වැනි දිනද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම* .- කඩුවෙල නගරයේ සිට මාලඹේ පාරේ කි. මී. 3.2ක් පමණ ගියවිට හමුවන ප්‍රධාන මාර්ගයෙන් දකුණට ඇති වැලිවිට පාරට හැරී එම මාර්ගයේ කි. මී. 1/4ක් පමණ ගමන් කළ විට පාරේ දකුණු පසින් පාරට මායිම්ව අංක 1 වන මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් වෙතොත් එම මුදල,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත රත්නපුර නවනගරයේ අංක 54, මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ කළමණාකරු වෙත ගෙවිය යුතුය. දූරකථන අංක : 045-2230818 සහ අංක 045-2223084.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඒ. එස්. ලියනගේ - සා.වි.
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂාපරිවර්තක.

අංක 228/ඒ,
වලව්වත්ත කැස්බෑව,
දූරකථන අංක : 2703478, 0777-459823.

05-20

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතුයි.
5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | තැපැල් (මෙරට) |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| (අ) | I වන කොටස | 31 0 | 5 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් ක | 11 0 | 5 0 |
| (ආ) | I වන ඡේදය | 10 0 | 5 0 |
| | II වන ඡේදය | 12 0 | 5 0 |
| | III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2008 | | | |
| මැයි | 2008.05.02 | සිකුරාදා | 2008.04.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.09 | සිකුරාදා | 2008.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.16 | සිකුරාදා | 2008.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.23 | සිකුරාදා | 2008.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.30 | සිකුරාදා | 2008.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2008.06.06 | සිකුරාදා | 2008.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.06.13 | සිකුරාදා | 2008.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.06.20 | සිකුරාදා | 2008.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.06.27 | සිකුරාදා | 2008.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2008.07.04 | සිකුරාදා | 2008.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.11 | සිකුරාදා | 2008.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.18 | සිකුරාදා | 2008.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.25 | සිකුරාදා | 2008.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.